# 01 ගෘහ අභ්‍යන්තරය හා ගෙවත්ත අලංකරණය කිරීම

ප්‍රසන්න ජීවන පරිසරයක් ඇති කිරීමෙහි ලා නිවසෙහි අභ්‍යන්තර හා බාහිර පරිසරය අලංකාර ලෙස පවත්වා ගැනීම වැදගත් වේ. ඒ සඳහා පුද්ගලයකු සතු නිර්මාණශිලී හැකියාව බෙහෙවින් ඉවහල් වේ.

නිර්මාණකරණයේ දී කලා මූලිකාංග හා මෝස්තර මූලධර්ම නිසි ලෙස යොද ගැනීම නිර්මාණයක සාර්ථකත්වයට හේතු වේ.

මෙම පරිච්ඡේදය තුළින් කලා මූලිකාංග හා මෝස්තර මූලධර්ම හඳුනා ගැනීමත්, අභ්‍යන්තර හා බාහිර අලංකරණයේ දී ඒවා යොද ගැනීමේ හැකියාව වර්ධනය කිරීමත් අපේක්ෂා කෙරේ.



## 1.1 කලා මූලිකාංග

නිර්මාණයක් ගොඩනැගීමේ දී අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු දෑ කලා මූලිකාංග ලෙස හැඳින්වේ. එනම්


- රේඛා
- හැඩය
- වර්ණය
- වයනය

### රේඛා

නිර්මාණයක් ගොඩ නැගීමට රේඛා අත්‍යවශ්‍ය වේ. නිර්මාණයෙහි ස්වභාවය අනුව යොද ගන්නා රේඛා විවිධ වන අතර ම රේඛා මඟින් විවිධ හැඟීම් දනවයි.

- සිරස් රේඛා
- තිරස් රේඛා
- වක්‍ර රේඛා
- අක්වක් රේඛා
- විකර්ණකාර රේඛා

**සිරස් රේඛා**




උස් බව, දැඩි බව, උසස් බව, සෘජු බව, ශක්තිමත් බව යන හැගීම් සිරස් රේඛා තුළින් ගෙන දෙයි.

**තිරස් රේඛා**




තැන්පත් බව, ශාන්ත බව, නිශ්චල බව, පුළුල් බව, මිටි බව යන හැගීම් තිරස් රේඛා තුළින් ගෙනදෙයි.

**වක්‍ර රේඛා**




සුන්දර, ප්‍රීතිමත්, සන්සුන්, සිත්කලු නැමෙනසුලු හා සියුම් බව වක්‍ර රේඛා හඟවයි.

## අක්වක් රේඛා



අක්වක් රේඛා කලබලකාරී බව, ක්‍රියාශීලී බව, චලනය, රිද්මයානුකූල බව, ලාලිත්‍යමය ස්වරූපය දනවයි. ගෘහ අලංකරණයේ දී බහුල වශයෙන් භාවිත නොකරයි.

## විකර්ණකාර රේඛා



කලබලකාරී බව, නොසන්සුන් බව, ක්‍රියාශීලී බව දනවයි. ඉදිරියට නැමුණු රේඛා මගින් ඉදිරියට තල්ලු කරන ස්වභාවයත්, පිටුපසට නැමුණු රේඛා පිටුපසට අදින ස්වභාවයත් පිළිබිඹු කරයි.

විවිධ රේඛා මගින් විවිධ හැඟීම් පෙන්නුම් කරන අතර නිර්මාණයේ ස්වභාවය අනුව උචිත රේඛා යොදා ගැනීමෙන් එහි අලංකාරය වැඩි දියුණු කර ගත හැකි ය.


**ක්‍රියාකාරකම 1.1**

පහත දක්වා ඇති රූපය නිරීක්ෂණය කර විවිධ රේඛා ගෘහ අභ්‍යන්තර අලංකරණයට යොදාගෙන ඇති ආකාරය හඳුනාගන්න.




### හැඩය

රේඛා එකතුවකින් කිසියම් හැඩයක් නිර්මාණය වේ. දිග හා පළල දක්වන රේඛා තුළින් ද්විමාන හැඩයක් ද, දිග, පළල හා උස දක්වන රේඛා තුළින් ත්‍රිමාණ හැඩයක් ද පෙන්නුම් කරයි.



ද්විමාන පිංතූරය




 

ත්‍රිමාණ පිංතූරය

## වර්ණය

වර්ණ හඳුනාගැනීමෙන්, වර්ණවල ගති ලක්ෂණ හඳුනාගැනීමෙන් හා වර්ණ සංකලන තුළින් නිර්මාණයක අගය වැඩිකරගත හැකි වේ. ගෘහ අභ්‍යන්තර අලංකරණයේ දී වර්ණ බෙහෙවින් උපයෝගී වේ. දැන් අපි වර්ණ හඳුනා ගනිමු.


## ප්‍රාථමික / මූලික වර්ණ (Primary colours)





රතු , කහ, සහ නිල් යන වර්ණ තුන ප්‍රාථමික වර්ණ හෙවත් මූලික වර්ණ ලෙස හඳුන්වයි. අනෙකුත් සියලු ම වර්ණ ගොඩනැගීම සඳහා උපයෝගී වන්නේ මෙම ප්‍රාථමික වර්ණ තුනයි.


## ද්විතීයික වර්ණ (Secondary colours)

ප්‍රාථමික වර්ණ දෙකක් එක සමාන ප්‍රමාණවලින් මිශ්‍ර කිරීමේ දී ද්විතීයික වර්ණ සෑදේ. ද්විතීයික වර්ණ වනුයේ කොළ, දම් සහ තැඹිලි යන වර්ණ තුනයි.




## අන්තර් මධ්‍යමික වර්ණ (Intermediate colours)




ප්‍රාථමික වර්ණයක් හා ඊට යාබද ව ඇති ද්විතීයික වර්ණයක් සමාන ප්‍රමාණවලින් මිශ්‍ර කිරීමෙන් අන්තර් මධ්‍යමික වර්ණ සාදා ගත හැකි ය. කහ තැඹිලි, රතු තැඹිලි, රතු දම්, නිල් දම්, නිල් කොළ, කහ කොළ අන්තර් මධ්‍යමික වර්ණ වේ.

### වර්ණ චක්‍රය

ප්‍රාථමික, ද්විතියික හා අන්තර් මධ්‍යමික වර්ණ ඇසුරෙන් ගොඩ නගා ගත් වර්ණ චක්‍රය ඉහත දක්වා ඇත. එය නිරීක්ෂණය කරන්න.



### තෘතියික වර්ණ

ද්විතීයික වර්ණ දෙකක් සමාන ප්‍රමාණවලින් මිශ්‍ර කළ විට තෘතීයික වර්ණ සැදේ.

උදා - දම් + තැඹිලි = තෘතීය රතු
තැඹිලි + කොළ = තෘතීය කහ
කොළ + දම් = තෘතීය නිල්

### උදාසීන වර්ණ

වර්ණ චක්‍රයට අතුළත් නොවූව ද සුදු, කළු, දුඹුරු, අළු යන වර්ණ උදාසීන වර්ණ ලෙස හඳුන්වන අතර ඒවා වර්ණ ගැන්වීමේ දී යොදා ගනු ලැබේ.

### උණුසුම් වර්ණ හා සිසිල් වර්ණ

ඉහත දක්වා ඇති වර්ණ චක්‍රයේ කහ වර්ණයේ සිට රතු දම් වර්ණය දක්වා ඇති වර්ණ උණුසුම් වර්ණ වන අතර දම් වර්ණයේ සිට කහ, කොළ වර්ණය දක්වා ඇති වර්ණ සිසිල් වර්ණ ලෙසත් හැඳින්විය හැකි ය.

අපි දැන් වර්ණවල ගුණාංග හඳුනා ගනිමු

**වර්ණවල ගුණාංග**

- වර්ණ නාමය (Hue)
- වර්ණයේ වටිනාකම හෙවත් අංග (Value)
- වර්ණයේ තීව්‍රතාව (Intensity)


### වර්ණ නාමය (Hue)

වර්ණයක් සුවිශේෂී ව හඳුන්වන නාමය වර්ණ නාමය ලෙස හැඳින්වේ.

උදා - මොනර නිල්, නා දලු රතු, ගොම කොළ

### වර්ණයේ අගය / වටිනාකම (Value)

වර්ණයක වටිනාකම ලෙස හඳුන්වන්නේ එම වර්ණයේ ලා හෝ තද බවයි. යම් වර්ණයකට සුදු පැහැය එකතු කිරීමෙන් විවිධ අගයන්ගෙන් යුත් ලා පැහැයන් ලබාගත හැකි ය. එමෙන්ම කළු පැහැය මිශ්‍ර කිරීමෙන් එම වර්ණයෙහි තද පැහැය ලබාගත හැකි ය. ලා වර්ණ අගයෙන් අඩු වන අතර තද වර්ණ අගයෙන් වැඩි ය.




වර්ණයක වටිනාකම/ අගය මැනීම සඳහා වර්ණ අගමානය භාවිත වේ. වර්ණ අගමානය යනු වර්ණයක අගය හෝ වටිනාකම දක්වන දර්ශකයක් හෙවත් මානයකි. එය වර්ණයක ලා බවේ සිට තද බව හෝ තද බවේ සිට ළා බව දක්වන දර්ශකයකි මානයකි.

## වර්ණයේ තිව්‍රතාවය

තිව්‍රතාව ලෙස හඳුන්වන්නේ වර්ණයක ඇති අඳුරු බව හෝ දීප්තිමත් බව ය. වර්ණයක දීප්තිමත් බව අඩු කිරීමට වර්ණ චක්‍රයේ එම වර්ණයට ප්‍රතිවිරුද්ධව ඇති වර්ණය එකතු කළ යුතු ය.

උදා - රතු වර්ණයේ දීප්තිමත් බව අඩු කිරීමට කොළ වර්ණයෙන් ස්වල්පයක් එකතු කිරීම

රතු වර්ණයට කළු වර්ණය එකතු කිරීමෙන් ද එහි දීප්තිමත් බව අඩුකර ගත හැකි ය

අපි දැන් ගෘහ අභ්‍යන්තර අලංකරණයේ දී වර්ණ යොදගැනීම පිළිබඳ විමසා බලමු

වර්ණ චක්‍රයේ වර්ණ ගැලපෙන ආකාරයට යොද ගැනීමෙන් වර්ණ ගැලපුම් ගොඩ නගා ගත හැකි ය. එවැනි වර්ණ ගැලපුම් දෙකක් පිළිබඳ ව ඔබට මෙහිදී අධ්‍යයනය කිරීමට හැකිවනු ඇත.

**ඒකවර්ණ ගැළපුම**

එක් වර්ණයක විවිධ අගයෙන් යුතු වර්ණ ඇතුළත් ගැළපුම ඒක වර්ණ ගැළපුම නම් වේ.



රතු පැහැයේ විවිධ අගයෙන් යුතු වර්ණ යොදගෙන නිදන කාමරයක් වර්ණ ගන්වා ඇති ආකාරය මෙම රූපයෙන් දක ගත හැකි ය.

**බද්ධ වර්ණ ගැලපුම**

වර්ණ චක්‍රයේ ප්‍රාථමික වර්ණයක් හා ඊට යාබද ව ඇති වර්ණ දෙකක් හෝ තුනක් සම්බන්ධ කරගනිමින් වර්ණ ගැළපීම මෙයින් අදහස් කෙරේ.

උදා - කහ, කහ තැඹිලි, තැඹිලි, රතු තැඹිලි



**ක්‍රියාකාරකම 1.2**

ඒක වර්ණ ගැළපුම හෝ බද්ධ වර්ණ ගැළපුම යොද ගනිමින් ඔබ නිවසේ කාමරයක් අලංකාර කර ගන්නා අයුරු පැහැදිලි කරන්න.



නොමිලේ බෙදහැරීම පිණිසයි

## වයනය

කිසියම් නිර්මාණයක මතුපිට පෘෂ්ඨය ස්පර්ශ කිරීමේ දී දැනෙන ස්වභාවය වයනය ලෙස හඳුන්වයි. දැකීමෙන් වුවද වයනය පිළිබඳ හැඟීමක් ඇතිකරගත හැකි ය. ගෘහ පිළිවල හා නිවසේ පවතින විවිධ පෘෂ්ඨවල ස්වභාවය විස්තර කිරීමේ දී මෘදු, සිනිඳු, ගොරෝසු, රළු යනා දී වශයෙන් වයනයන් විවිධ වේ. ගෘහයෙහි එක් ස්ථානයකට හෝ එක් භාණ්ඩයකට වුව ද විවිධ වයනයන් ඇතුලත් කිරීමෙන් අලංකාරය වැඩි කරගත හැකි ය. නිවසෙහි බිත්ති, ගෙබිම හා ගෘහ භාණ්ඩවල වයනයන්හි ගැලපීම මඟින් අලංකාරයක් ලබාගත හැකි ය.

කලා මූලිකාංග යොදා ගනිමින් කරනු ලබන නිර්මාණ සාර්ථක වීම සඳහා මෝස්තර මූලධර්ම අනුගමනය කිරීම වැදගත් වේ.

යම්කිසි ස්ථානයක හෝ භාණ්ඩයක, අලංකාරය හා ආකර්ශණීයබව ඇති කිරීමට මෝස්තර මූලධර්ම අනුගමනය කිරීම වැදගත් වේ.

**මෝස්තර මූල ධර්ම**

- තුලනය
- රිද්මය
- අවධාරණය
- එකඟත්වය
- සමානුපාතය

### තුලනය

තුලනය දෙයාකාරයකින් පෙන්නුම් කළ හැකි ය.

- විධිමත් තුලනය
- අවිධිමත් තුලනය

**විධිමත් තුලනය**

හැඩයෙන්, බරෙන්, ප්‍රමාණයෙන්, මෝස්තරයෙන්, වර්ණයෙන් එකිනෙකට සමාන භාණ්ඩ කිසියම් ස්ථානයක මධ්‍ය ලක්ෂ්‍යයේ සිට දෙපසට සම දුරින් ස්ථාන ගත කිරීම විධිමත් තුලනය ලෙස හැඳින්වේ. ගෘහ අභ්‍යන්තර මෙන් ම බාහිර අලංකරණයේ දී ද විධිමත් තුලනය පහසුවෙන් ඇති කළ හැකි ය.



## අවිධිමත් තුලනය

කිසියම් ස්ථානයක හැඩයෙන්, ප්‍රමාණයෙන්, උසින් එකිනෙකට අසමාන ගෘහ භාණ්ඩයක් හෝ උපාංග මධ්‍ය ලක්ෂ්‍යයේ සිට අසමාන දුරින් ස්ථාන ගත කිරීමෙන් තුලනය ඇති කිරීම අවිධිමත් තුලනය ලෙස දැක්විය හැකි ය.



මෙහි දී බරින් වැඩි විශාල භාණ්ඩ මධ්‍ය ලක්ෂ්‍යයට ආසන්න ව ද, බරින් අඩු භාණ්ඩ මධ්‍ය ලක්ෂ්‍යයට දුරස් ව ද තැබීමෙන් ඇතිවන තුලනය අවිධිමත් තුලනය ලෙස හැඳින්වේ.

**ක්‍රියාකාරකම 1.3**

නිවසේ අභ්‍යන්තර හෝ බාහිර අලංකරණයේ දී තුලනය පෙන්නුම් කර ඇති ආකාර නිරීක්ෂණය කරන්න.

## රිද්මය

එකම ලක්ෂණය නැවත නැවත පෙන්නුම් කිරීම මඟින් අලංකාරය ලබා දීම රිද්මය ලෙස හැඳින්වේ. ගෘහ අභ්‍යන්තර අලංකරණයේ දී රිද්මය විවිධ ආකාරයෙන් පෙන්නුම් කළ හැකි ය.



## සමානුපාතය

කිසියම් ඉඩ ප්‍රමාණයක් තුළ ඊට සාපේක්ෂ බරින් හා ප්‍රමාණයෙන් යුත් ගෘහ භාණ්ඩ සහ උපාංග එම ස්ථානයේ තැන්පත් කිරීමෙන් සමානුපාතය ඇති කර ගත හැකි ය.



## අවධාරණය

කිසියම් ස්ථානයක ප්‍රමුඛව පෙන්නුම් කරන ලක්ෂණයක් තුළින් පුද්ගලයෙකුගේ සිත ක්ෂණිකව ඇද ගන්නා ආකාරයට සකස් වීම අවධාරණය ලෙස හඳුන්වයි.

හැඩයෙහි, ප්‍රමාණයෙහි, වර්ණයෙහි හෝ වයනයෙහි කිසියම් වෙනසක් ඇති කිරීමෙන් අවධාරණය ඇති කළ හැකි ය.



ප්‍රමාණයෙන් විශාල ස්ථානයක අවධාරණය යොමු කරන කේන්ද්‍රස්ථාන දෙකක් වුවද තිබිය හැකි ය. කිසියම් ස්ථානයක එක් භාණ්ඩයක් හෝ උපාංගයක් දෙසට ඇස ආකර්ෂණීය වීමට සැලැස්වීම අවධාරණය මඟින් සිදු වේ. මෙහිදී සෙසු ගෘහ භාණ්ඩ හා උපාංග නිලීන ව ඉදිරිපත් කළ යුතු ය.

නිවසක් තුළ බුමුතුරුණු, ලාම්පු හා ලාම්පු ආවර්ණ, බිත්ති සැරසිලි, මල් සැකසුම්, විදුලි පහන්, ගෘහ භාණ්ඩ කට්ටල වැනි දෑවලින් අවධාරණය ඇති කරගත හැකි ය. බාහිර අලංකරණයේ දී විවිධ ශාක, ප්‍රතිමා, දිය ඇලි, උද්‍යාන ලාම්පු, පොකුණු ආදිය මඟින් ද අවධාරණය ඇති කළ හැකි ය.

## ඒකඟත්වය

නිවසෙහි කිසියම් ස්ථානයක ගෘහ භාණ්ඩ හා උපාංග තැන්පත් කිරීමේ දී ප්‍රමාණයෙන්, හැඩයෙන්, වර්ණයෙන් සහ වයනයෙන් එකිනෙකට ගැළපීම ඒකඟත්වය ලෙස හඳුන්වයි.





මෙහි ගෘහ භාණ්ඩ හා උපාංගවල ස්වභාවය කෙරෙහි නෙත් යොමු කරන්න. ස්ථානයේ ඉඩකඩ ගැලපෙන ආකාරයට පුටු කට්ටලය ස්ථාන ගත කිරීම මෙන්ම ජනේලවල සහ මේස ආවරණවලට යොදා ඇති මෝස්තරය තුළින් ඒකාග්‍රත්වය පිළිඹිඹු වේ.

**ක්‍රියාකාරකම 1.4**

පහත දැක්වෙන රූප සටහන් අධ්‍යයනය කරන්න.





මෝස්තර මූලධර්ම උපයෝගී කරගෙන ගෘහ අලංකරණය කර ඇති ආකාරය පැහැදිලි කරන්න.

**ගෙවත්ත අලංකරණය කිරීම**

ගෘහ අභ්‍යන්තර අලංකරණය පිළිබඳ දැනුවත් වූ අපි ගෙවත්ත ද මනා ලෙස සංවිධානය කර ගැනීමෙන් අලංකාරය වැඩි කර ගන්නා ආකාරය සොයා බලමු.

බාහිර අලංකරණයේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

- සීමා/මායිම් පවත්වා ගැනීම
- පාංශු සංරක්ෂණය සඳහා පියවර ගැනීම
- ජලය බැසයාම සඳහා උපක්‍රම යෙදීම
- අලංකරණය ඇති කිරීමේ විවිධ ක්‍රම යොදා ගැනීම

## සීමා/මායිම් පවත්වා ගැනීම

ගෙවත්තේ සීමා දැක්වීම මඟින්, ආරක්ෂාව සැලසීම, පාංශු ඛාදනය වළක්වා ගැනීම ආදී කටයුතු මැනවින් පවත්වා ගැනීමට හැකි වේ. මේ සඳහා කම්බි වැට, දඬු වැට, බෝග වැට, තාප්ප, දැල්, සිමෙන්ති ග්‍රිල්, ආදිය යොදා ගනියි.

**පාංශු සංරක්ෂණය සඳහා පියවර ගැනීම**

ගෙවත්තෙහි පස ඛාදනයට ගොදුරු වීමෙන් සරුපස සේදී ගොස් පහත් ස්ථානවල තැන්පත් වීමක් සිදු වේ. සෝදපාලුවෙන් පස ආරක්ෂා කරගැනීමට පඳුරු සහිත ශාඛ වැවීම, කාණු පද්ධතිය සකස් කිරීම, ගල් වැටි යෙදීම, පිඩැලි ඇල්ලීම වැනි දෑ කළ හැකි ය.

නොම්ලේ බෙදහැරීම පිණිසයි

### ජලය බැසයාමේ උපක්‍රම

ගෙවත්තේ ජලය බැස යාමට කාණු හා නළ පද්ධති භාවිත කරන අතර කිසියම් ආනතියකට අනුව නළ ඇතිරීම කළ යුතු වේ.

### අලංකාරය ඇති කිරීමේ විවිධ ක්‍රම

ගෙමිදුලෙහි හා ගෙවත්ත අලංකාර කිරීමේ දී භූමියෙහි ඉඩ ප්‍රමාණය, හැඩය, බෑවුම පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.

විසිතුරු ශාක වැවීමෙන් දැකුම්කලු බවක් ඇති වේ. එමෙන් ම ශාක විවිධ හැඩවලට කප්පාදු කිරීමෙන් ද අලංකාරය වැඩි කරගත හැකි වේ.

විවිධ හැඩවලට මල් පාත්ති සකස් කිරීමෙන් අලංකාරය වැඩි කරගත හැකි ය. එමෙන්ම විවිධ වර්ණ මිශ්‍ර වන සේ අලංකාර මල් වර්ග වැවීම කළ හැකි ය. මල් පෝච්චි, එල්ලන බඳුන්, ජනේල ඉදිරිපිට විවිධ හැඩයන්ගෙන් සකස් කළ බක්කි තුළ ද මල් වැවීම කළ හැකි ය.

පොකුණු, වතුර මල්, උද්‍යාන මේස, බංකු, පුටු, ආරුක්කු, පාලම්, ප්‍රතිමා, බිම් ඇතුරුම්, උද්‍යාන ලාම්පු, ඔන්චිල්ලා, දියඇලි ආදිය යෙදීමෙන් ද පරිසරයෙහි දර්ශනීය බව ඇති කළ හැකි ය.

පහත දැක්වෙන පින්තූරයෙන් නිවස අවට ගෙවත්ත අලංකාර ලෙස පවත්වා ගැනීම පිළිබඳ මනා අවබෝධයක් ලබාගත හැකි ය.



**ක්‍රියාකාරකම 1.5**

මෙම රූපය අධ්‍යයනය කිරීමෙන් කලා මූලිකාංග හා මෝස්තර මූලධර්ම උපයෝගී කරගනිමින් ගෙවත්ත අලංකාර කර ඇති ආකාරය පැහැදිලි කරන්න.



**සාරාංශය**

නිර්මාණයක් ගොඩ නැගීමේ දී හා අලංකරණයේ දී කලා මූලිකාංග හා මෝස්තර මූලධර්ම වැදගත් වේ. කලා මූලිකාංග ලෙස රේඛා, හැඩය, වයනය හා වර්ණය නම් කළ හැකි ය. මෝස්තර මූලධර්ම ලෙස තුලනය, රිද්මය, සමානුපාතය, අවධාරණය හා එකඟත්වය සඳහන් කළ හැකි ය.

ගෘහ අභ්‍යන්තර හා බාහිර අලංකරණයේ දී කලා මූලිකාංග හා මෝස්තර මූලධර්මවලට අනුකූලවන සේ යොදා ගැනීමෙන් නිවස ප්‍රසන්න, සුවදායි හා දැකුම්කලු ස්ථානයක් බවට පත් කළ හැකි ය.

**අභ්‍යාස**

1. කලා මූලිකාංගයක් වන රේඛා වර්ග කර දක්වන්න.
2. ද්විතියික වර්ණ නම් කරන්න. එම වර්ණ ගොඩනැගෙන ආකාරය පැහැදිලි කරන්න.
3. වර්ණ අගමානය හඳුන්වන්න.
4. කලා මූලිකාංග හෝ මෝස්තර මූලධර්ම උපයෝගි කර ගනිමින් ඔබගේ ගෙවත්ත සකස් කර ගත හැකි ආකාරය විස්තර කරන්න.